2016.03.29

Learning Resource Centre
De Mazenod

# ද මැසනොද් විදුහල, කඳාන
# රෝමානු කතෝලික ධර්මය
# 1 කොටස

**11 ශ්‍රේණිය** කාලය පැය 1යි

1. ශු .බයිබලයේ පුරන ගිවිසුමට අයත් පොත්වල අඩංගු වන්නේ කුමන පොත්ද ?

1) සිරක් 2) මලාකි 3) නෙහෙමියා 4) දනියෙල්

2. ලූක්තුමා පිළිබඳ නිවැරදි ප්‍රකාශය වන්නේ ,

1) වෛද්‍යවරයෙකි . 2) වෛද්‍යවරයෙකි 3) ගුරුවරයෙකි . 4) ශාස්තරවේදියෙකි

3. පාවුළු තුමාගේ සන්දේශවල අරුඩ කතෘත්වයෙන් ලියූ සන්දේශ වන්නේ ,

1) කොරෙන්ති,පිලමොන් 2) තෙසලෝනික,තිතස්

3) එපීස, පිලිප්පි 4)2 තෙසලෝනික ,2 තිමති

4. "තියෝපිලස්" යන්නෙහි අර්ථය ,

1) දෙවියන්වහන්සේ රැකගනී . 2) දෙවියන්වහන්සේට ප්‍රේමකරන්නා,

3) දෙවියන්වහන්සේගේ මිත්‍රයා , 4) දෙවියන්වහන්සේගේ ශක්තියි ,

5 පාවුළු තුමා අයත් ගෝත්‍රය වන්නේ ,

1) බෙන්ජමින්ගේ, 2) සීමොන්ගේ , 3) ලෙවීගේ 4) ජුදාගේ ,

6 එළිදරව් සාහිත්‍යයේ ලක්ෂණයක් නොවන්නේ කුමක්ද ?

1) පූර්ණත්වය 2) ද්විත්තවාදය

3).යුගාන්තවාදය 4) ආරුඪ නාමයකින් ඉදිරිපත් කර තිබීම .

7. දිව්‍යමය වූ යහපතින් කෙනෙකු වළකාලීම මගින් අප සිදුකරන පාපය වන්නේ ,

1) සහෝදරත්වයට විරුද්ධව 2) ශු.සභාවට විරුධව

3) අසල්වැසි ප්‍රේමයට විරුධව 4) දේව ප්‍රේමයට විරුධව

8. ශු .පාවුළු තුමාගේ පළමු දර්මදූත චාරිකාවේ දේශනා කල නගර වන්නේ

1) තාර්සස්,දර්බය ,සිලුකිය 2) ඉකොනිය ,තාර්සසය ,එපීසය 3) සලමීසය ,පාපස් ,පරගා

4)ලුස්තාව,තොවසය ,ග්‍රීසිය

9. ජේසුස් වහන්සේ විසින් පේදුරුතුමාට ලබාදුන් බලයක් නෝවන්නේ ,

1) පව් සමාකිරිම 2) ප්‍රාතිහාර්ය කිරිම 3) දේශනා කිරීම 4) පව් කරුවන්ට දඩුවම් කිරීම.

10. උප්පත්ති පොතේ සඳහන් පණිවිඩය ,

1) තාවකාලිකය 2) සර්වකාලිකය 3) විද්‍යාත්මකය 4) ඉතිහාසාත්මකය

11. "ටෝරා" යන වචනය භාවිත වන භාෂාව වන්නේ,

1) ග්‍රීක භාෂාව 2) ලතින් භාෂාව 3) හෙබ්‍රෙව් භාෂාව 4) ඇරමයික් භාෂාව

12) දේශක දිවසිවරයෙකු වන්නේ ,

1) යෙසායා දිවැසිවරයා 2) මීකා දිවැසිවරයා 3) එසකියෙල් දිවැසිවරයා 4) එලියා දිවැසිවරයා

13 "සෙප්ටුවාජින්ත " ලෙස හඳුන්වන බයිබලීය පිටපතක් වනුයේ

1) හෙබ්‍රෙව් පිටපත 2) ග්‍රීක පිටපත 3) මැසරෝටික් පිටපත 4) ලතින් පිටපත

14, ග්‍රීක භාෂාවෙන් "ප්රෝෆටස් " යන නමින් හැඳින්වූයේ ,

1).දේව පණිවිඩය ගෙනියන්නා , 2) කෙනෙකුවෙනුවෙන් කථාකරන්නා

3) දේව කැමැත්ත ඉටුකරන්නා , 4) සාස්ත්‍ර කියන්නා

15 "මෙන්න මා මෙහිය .මා යැවුවමනව."මෙය කිනම් දිවසිවරයෙකුගේ ප්‍රකාශයක්ද ?

1) එසකියෙල් දිවැසිවරයාගේ 2) ජෙරමියා දිවැසිවරයාගේ

3) දානියෙල් දිවැසිවරයාගේ 4) යෙසායා දිවැසිවරයාගේ

16. කතෝලික බයිබලයේ පුරාණ ගිවිසුමට ඇතුලත් කර ඇති පොත් ගණන වන්නේ

1) 10කි 2) 5කි 3) 7කි 4) 46කි

17 "මට විරුධව කැරලිගැසූ කැරලිකාර ජාතියක් වන ඊස්රායල්වරුන් වෙත මම නුඹ යවමි "මෙසේ ප්‍රකාශ කලේ කාහටද ?

1) ජුදස්හට 2) යෙසායා හට 3) ජෙරමියා හට 4) එසකියෙල් හට

18 අපට නිවැරදි මග යාමට අවවාද කරනා මාර්ගයක් නොවන්නේ

1) හර්ද ශාක්ෂිය 2) රූපවාහිනිය 3) ආගමික නායකයන් 4) දෙමාපියන්

19 ප්‍රාග් ඉතිහාසික යුගයන්හි ඇති කතාන්දර වලින් උගත හැක්කේ

1) මැවීම පිළිබද විද්‍යාත්මක තොරතුරුය 2) මැවීම පිළිබද ඓතිහාසික තොරතුරු ය

3) දෙවියන් වහන්සේ ලෝකයේ මැවුම් කරු බව ය 4) යාවේ සම්ප්‍රදායෙන් ලියවී ඇති බව ය

20 යාවේ සම්ප්‍රදායට අයත් කතාවක් නොවන්නේ

1) මැවීම පිළිබද දෙවන කතාව 2) ඉසාක් පූජා කිරීම

3) කායින් ආබෙල් 4 ) ආදම් හා ඒව පාපයට වැටීම

21. ද්විතිය නීති සම්ප්‍රදායේ ප්‍රධාන තේමාව වන්නේ

1) දෙවියන් වහන්සේ මිනිසාට ඉතා සමිපව සිටින බව ය

2) දෙවියන්වහන්සේ විවිධ මාර්ගවලින් අපට කතා කරන බව ය

3) දෙවියන්වහන්සේට පමණක් වන්දනා කලයුතු බව ය

4) ඉරුදින ශුද්ධවත් ලෙස ගත කල යුතු බව ය

22 "මාගේ ඇටකටු සැදෙන විට මා එහි වූ බව ඔබ දැනසිටි සේක"බයිබලයේ කිනම් පොතකින් උපුටා ගැනීමක්ද ?

1) උත්පත්ති පොත 2) ප්‍රඥා සාහිත්‍ය පොත

3) උපදේශකයාගේ පොත 4) ගීතාවලිය

23 උත්තම පූජක යාඥාවේ ප්‍රධාන කොටසක් නොවන්නේ

1)දෙවියන්වහන්සේ වෙනුවෙන් යැදීම 2) ශ්‍රාවකයන් වෙනුවෙන් යැදීම

3) අනාගත සභාව වෙනුවෙන් යැදීම 4) තමන් වහන්සේ වෙනුවෙන් යැදීම

24. "කිසියම් කෙනෙකු මුළු ජීවිත කාලයේදී නොසලකා හැරිය යමක් ඔහුගේ මරණ මොහොතේදී ඉටු කල නොහැකිය '. මෙම ප්‍රකාශය සිදු කලේ ,

1) තෙරේසා මවුතුමිය 2) ශු .දෙවන ජුවාම් පාවුළු පාප්තුමා

3) ශු .ජුසේ වාස් මුනිතුමා 4) ශු .මක්සිමිලියම් කොල්බේ මුනිතුමා

25. "දෙවියන්වහන්සේගේ මදාස්තකයාණෝ" විශ්ව ලේඛනය ඉදිරිපත් කල ශුද්ධෝත්තම පියතුමා වන්නේ .

1) 12 වෙනි පියුස් පාප්තුමා 2) 6වෙනි පාවුළු පාප් තුමා

3) 2වෙනි ජුවාම් පාවුළු පාප්තුමා 4)ප්‍රැන්සිස් පාප්තුමා

26 . අනුරාධපුර පදවියේ රදගුරුතුමා වන්නේ ,

1 ) අති උතුම වින්ස්ටන්ට් ප්‍රනාන්දු හිමිපානන් 2) අතිඋතුම් නෝබට් අන්ද්‍රාදි හිමිපානන්

3) අති උතුම වැලන්ස් මෙන්ඩිස් හිමිපානන් 4) අති උතුම ක්ලීටස් චන්ද්‍රසිරි හිමිපානන්

27) පූදා පාස්කු භෝජනයේ මූලිකාංගයක් වන්නේ

1) නුමුහුන් රොටි හා මන්නා ආහාරය 2) තිත්ත පලා හැ පලතුරු

3) නුමුහුන් රොටි හා තිත්තපලා ආහාරය 4) පාස්කු බැටළුවා හා පලතුරු

28 . පඩුරු පිදීමේ පිළිවෙතේ පරමාර්ථයක් නොවන්නේ

1) පූප සහ මිදියුස ගෙන එම 2) ජනවන්දන පිළිවෙත ඉටුකිරීම

3)දුගී දුප්පත් අයට දියහැකි පඩුරු ගෙන එම 4) ශු. සභාවේ නඩත්තුව සඳහා පඩුරු පිදීම

29. දිව්‍ය පූජාවේදී දක්නට ලැබෙන මූලසුනේ යැදුමක් වන්නේ ,

1) පොදු යැදුම 2) මනස්ථාපනයේ යැදුම

3) ශ්‍රාවකයින් වෙනුවෙන් යැදුම 4) ස්වර්ගයෙහි වැඩසිටින යැදුම

30. සාමාන්‍ය සමයේ ඉරුදිනයන් වන්නේ

1) 36 කි 2) 34 කි 3) 24 කි 4) 46 කි

31) "ලිටුර්ජිය" යනු ..

1) වැටුපක් නොලබා කරනා සේවයකි . 2) පූජක කාර්යය ඉදිරියට ගෙන යාමකි .

3) ජනතාව වෙනුවෙන් වැටුපක් නොලබා කරනා සේවයකි 4) ශු. සභාව එක්ව කරන වන්දනාවකි .

32 . "තම ලාභය උදෙසා පමණක් කටයුතු කිරීම "කීවෙනි පනතට එරෙහිද ?

1) 6 වෙනි පනත 2) 7 වෙනි පනත 3) 10 වෙනි පනත 4) 8 වෙනි පනත

33 . “ඔබගේ ශරීරය ඔබට දෙවියන් වහන්සේ විසින් දෙන ලද ඔබ තුල වැඩවසන ශුද්ධාත්ම මන්දිරය වන බව නොදන්නහුද”මෙම ප්‍රකාශය උපුටා ගන්නා ලද්දේ ..

1) 1 කොරෙන්ති ලිපිය 2) 2 කොරෙන්ති ලිපිය 3) රෝම ලිපිය 4) එපීස ලිපිය

34. “ මින්මතු ඔබ පොලෝ තලය මත සාප ලද්දෙක් වේවා “මෙම ප්‍රකාශය කා හට පවසන ලද්දක් ද ?

1) ආදම් ට 2) ඒව ට 3) කායින් ට 4)සර්පයා ට

35. “දරුවනි සියලු කාරණාවලදී දෙමාපියන්ට කීකරු වන්න “ මෙම ප්‍රකාශය උපුටා ගන්නා ලද්දේ ..

1) හිතෝපදෙශයෙනි 3) කොලොස්සි ලිපියෙනි

3) උපදේශකයාගේ පොතෙනි 4) ගීතාවලියෙනි

36) පුරවැසි යුතුකමක් හා වගකීමක් නොවන්නේ ,

1) පාලකයින්ට ගරු කිරීම 2) නියමිත ලෙස බදු ගෙවීම

2) පුරවැසි නිදහසට ගරු කිරීම 3) තම වැටුපට වහල් නොවී සේවය කිරීම

37) “ මරියතුමියගේ ශ්‍රී හර්දයේ හමුදාව “ නමැති සංවිධානය ආරම්භ කලේ ,

1) භාග්‍යවන්ත තෙරේසා තුමිය 2) ශු. 2 වන ජුවාම් පාවුළු මුනිතුමා

3) ශු.මක්සිමිලියම් කොල්බේ මුනිතුමා 4)ශු. මරිය ගොරෙට්ටි මුනිවරිය

38. පළමු මිනිසා වන ආදම්ට දෙවියන්වහන්සේ දුන් දඩුවමක් නොවන්නේ ,

1) නුඹට පලා කන්නට සිදුවන්නේහි ය . 2) දූවිල්ලෙන් වූ නුඹ දූවිල්ලට ම යන්නෙහිය .

3) පොළොවෙන් නුඹ නෙරපා දමනු ඇත . 4) දිවි ඇති තෙක් නුඹ වෙහෙස වී වැඩ කරන්නෙහිය .

39) ලූක් සුභ ආරංචිය ලියන ලද කාලපරිච්ඡේදය වන්නේ ,

1) ක්‍රි,ව 64 – 70 අතර 2) ක්‍රි.ව 80 – 90 අතර 3) ක්‍රි. ව 90 -100 අතර 4) ක්‍රි. ව 80 -85 අතර

40) ජොහාන් තුමා තම සුවිශේෂය ලිවීමේ අරමුණ වන්නේ

1) කිතුනුවන් දිරිමත් කිරීමට

2) විස්වාසය ඇතිකර ලීමට

3) ක්‍රිස්තුන් වහන්සේ අන්‍ය ජාතින්ගේද ගැලවුම කරු බව පෙන්වීමට

4) නව මෙසියානික ගුරුවරයා බව පෙන්වීමට

4 . 04 . 2016

# කතෝලික ධර්මය
# රෝමානු කතෝලික ධර්මය
## 11 කොටස

Learning Resource Center
R
De Mazenod College
Kandana

**11 ශ්‍රේණිය** | කාලය පැය 2 යි

(1).

1. පූප කැඩීමෙන් සංකේතවත් කරන්නේ කුමක්ද ?
2. දිව්‍ය සත්ප්‍රසාදීය ලක්ෂණ දෙකක් නම් කරන්න ?
3. බ්‍රිතාන්‍ය යුගය තුල මෙරට සේවය කළ ධර්මදූත නිකායන් දෙකක් නම් කරන්න .
4. ක්‍රිස්තුස් වහන්සේ අන්තිම රාත්‍රී බෝජනයේදී ඉටු කල කාර්යයන් දෙකක් සදහන් කරන්න.
5. මරියදාව ඇතිව දිවි ගෙවන්නට කල යුතු කාර්යයන් දෙකක් සදහන් කරන්න .
6. එලොහිම් සම්ප්‍රදායේ භාෂා ශෛලය කුමක්ද ?
7. සමදර්ශක සුවිශේෂ 3ක් සදහන් කරන්න .
8. මිනිසාගේ උතුම්කම විද්‍යමානවන කරුණු දෙකක් සදහන් කරන්න .
9. ස්ත්‍රිය යන නමෙහි අර්ථය කුමක්ද ?
10. කතෝලික සභාව පිළිගත් සභාවන් 4ක් සදහන් කරන්න..

(2).

1. ද්විතීය සම්මත ග්‍රන්ථ දෙකක් සදහන් කරන්න .
2. ද්විතීය සම්මත ග්‍රන්ථ දේවානුභාවයෙන් ලියවී ඇති බවට සාක්ෂි තුනක් සදහන් කරන්න .
3. පංච පුස්තකයේ වැදගත්කම පිලිබදව මිතුරෙකුට පැහැදිලි කරන ආකාරය වචන 75 කින් පමණ පැහැදිලි කරන්න.

(3).

1. ජනවන්දනා වසර තුල පසුතැවීමේ කාල වකවානු දෙක නම් කරන්න .
2. ජනවන්දනා වසර තුල භාවිතා කරන වර්ණ 3ක් සදහන් කරන්න .
3. "දෙවියන්වහන්සේට වන්දනා කිරිම කිතුනුවගේ පරම යුතුකම වේ" කිතුනුවෙකු ලෙස එම යුතුකම ඉටුකිරීම සදහා ඔබ විසින් කලයුතු කාර්යන් 5ක් සදහන් කරන්න .

(4).

1. ශු. බයිබලයේ පැරණි ගිවිසුමේ සදහන් ඉතිහාස පොත් දෙකක් සදහන් කරන්න
2. හෙබ්‍රෙව් ප්‍රඥාවේ ප්‍රභේද තුනක් දක්වන්න .
3. අද කාලයේ සලකුණු තුලින් දෙවියන්වහන්සේ අපට අනාවරණය වන මාර්ග දෙකක් නම් කර, ඊට කිතුනු දරුවෙකු ලෙස ප්‍රතිචාර දක්වන අයුරු විස්තර කරන්න .

(5).

1. දිව්‍ය පූජාව තුල ආරම්භයේ දක්නට ලැබෙන ගෞරවයේ සංකේත 2ක් සඳහන් කරන්න .

2. ස්තෝත්‍ර යාගික පිළිවෙතේ ප්‍රධාන කොටස් 3 දක්වන්න .

3. පහත සඳහන් මාතෘකා යටතේ විස්වාසකයන්ගේ යැදුම බැගින් නිර්මාණය කරන්න .

- ශු .සභාවේ අවශතා උදෙසා
- ලෝක ගැලවීම හා ජන නායකයින් උදෙසා
- පීඩිත ජනතාව උදෙසා
- අපොස සා . පෙළ විභාගෙට සූදානම් වන දරුවන් උදෙසා.

(6).

1. ජෝසප් පොතිපර්ගේ බිරිඳගේ යෝජනාවට එකඟ වූයේ නම් කඩවන පනත් දෙක සඳහන් කරන්න .

2. ගබ්සාව බරපතල පාපයක් වන්නේ කුමක් නිසාද ?

3. ආත්ම දමනය ඇතුව සිටීමට කිතුනු දරුවෙකු ලෙස ඔබට කල හැකිදේ පැහැදිලි කරන්න .

(7).

1. මැවීමේ දෙවන කතාවට අනුව මිනිසාගේ උතුම්කම පෙන්නුම්කරන ලක්ෂණය ලියන්න

2. ඒව රුචියට වහල්වී වැරදි තීරණ ගත්තාය. මෙයින් අපට ලැබෙන පණිවිඩ 3ක් සඳහන් කරන්න .

3. අද සමාජය තුල පාපය ක්‍රමයෙන් වර්ධනය වන බව පෙන්වීමට උදාහරණ 5ක් සඳහන් කර ඒවා තුරන් කිරීමට ඔබ කරනා යෝජනා 5ක් පැහැදිලි කරන්න .

(8).

1. "සුබාරංචිය" යන නමෙහි අර්ථය සඳහන් කරන්න .

2. ලූක් තුමාගේ සුබාරංචිය සඳහා භාවිත වන වෙනත් නම් 3ක් සඳහන් කරන්න .

3. ශු .ජොහාන් සුභාරංචිය පිලිබඳ කරුනු 5ක් කෙටියෙන් විස්තර කරන්න .